**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2017**

---

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ වටිනාකම රු. 1,192,086 ක් වූ අතර ඉන් ශ්‍රම වෙළෙඳපොල සමීක්ෂණය සඳහා ගෙවිය යුතු රු. 250,000 ක ශේෂයක් වසරකට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනත අනුව සභාව විසින් එක් මූල්‍ය වර්ෂයක් සඳහා අවම වශයෙන් රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂය සඳහා රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,167,580 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 945,003 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,222,577 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විදේශීය පුහුණු වැඩසටහන් මඟින් රු. 5,788,680 ක් ලාභ ඉපයීම මෙම වර්ධනය සඳහා මූලික හේතුව වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී ඌණතාවයක්ද අනෙකුත් වර්ෂවල මූල්‍ය අතිරික්තයන්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ රු. 9,634,876 ක සිට 2017 වර්ෂයේ රු. 21,610,655 ක් දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1. කාර්යසාධනය

-----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මඟින් වර්ෂය තුළ ව්‍යාපෘති / වැඩසටහන් 29 සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 15.65 ක් ප්‍රතිපාදන කර තිබුණ ද එම වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. මිලියන 17.39 ක් වැය කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම මඟින් වෙන්කර තිබූ මුදල් ප්‍රමාණය ඉක්මවා රු. මිලියන 1.74 ක් වැය කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබූ රු. මිලියන 2.93 වූ ව්‍යාපෘති / වැඩසටහන් 08 ක් අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර ඒ අතුරින් රු. මිලියන 0.65 ක් වූ වැඩසටහන් 03 ක භෞතික කාර්යසාධනය සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි.

(ඇ) ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් වාර්ෂිකව ජර්නල් 2 ක් පිළියෙල කර නිකුත් කිරීමට ඉලක්ක කළ ද 2017 වර්ෂයේදී ඉන් එක් ජර්නලයක් පමණක් නිකුත් කර තිබුණි.

## 5. තිරසර සංවර්ධනය

-------------------

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

------------------------------------------------

තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

----------------------

සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මගින් ද වර්ෂය තුළ කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබූ 2011 නොවැම්බර් 15 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව ඇගයීම සඳහා අභ්‍යන්තර විගණනයක අවශ්‍යතාවය දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය 2017 දෙසැම්බර් මාසයේදී සංශෝධනය කර තිබූ නමුත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සංශෝධිත අයවැය අනුව පුනරාවර්තන වියදම්වල සියයට 10 සිට සියයට 65 දක්වා ද ප්‍රාග්ධන වියදම්වල සියයට 15 සිට සියයට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය විය. අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් නොකල පරිගණක මිලදී ගැනීම සඳහා රු.527,420 ක් වියදම් දරා තිබූ අතර වාහන ප්‍රාග්ධන වැය සඳහා වෙන්කරන ලද රු. 400,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

ස්ථාවර වත්කම් ලේඛනයේ පවතින පිරිවැය රු.354,332 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 26 ක ඌනතාවයක් සම්බන්ධව 2015 නොවැම්බර් 19 දිනැති පරීක්ෂණ වාර්තාවේ වූ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් පාලනය | වත්කම් ඉවත් කිරීමේදී නිවැරදි ක්‍රමවේද අනුගමනය නොකිරීම. |
| (ආ) | කාර්යසාධනය | පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ සටහන් සකස් කර ක්‍රියාත්මක නොකිරීම. |